# ප්‍රසම්පාදන දැන්වීමයි

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## ස්වදේශ කටයුතු අංශය

# ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් ලංසු කැඳවීම

# 2025 - 2026

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ඇති ස්වදේශ කටයුතු අංශය, කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන පිහිටි 'නිල මැදුර' පරිපාලන සංකීර්ණය, කොළඹ දිස්ත්‍රික් ලේකම් නිල නිවස සහ නිදහස් මන්දිර පරිශ්‍රය ආවරණය වන පරිදි 2025/2026 වර්ෂවලට අදාළව ආරක්ෂක සේවා සැපයීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය විසින් ලංසු කැඳවනු ලැබේ.

02. 2025.08.07 දින සිට 2025.08.26 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා ආපසු නොගෙවන රු. 4,000.00 ක ගාස්තුවක් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයේ, 16 වන මහලේ පිහිටි මූල්‍ය අංශයේ සරප් අංශය වෙත ගෙවා, ලබා ගන්නා වූ රිසිට්පත සමග රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් නමින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රසම්පාදන ශාඛාවෙන් ලංසු ලියවිලි ලබා ගත හැකිය. එකී සඳහන් කාල සීමාව තුළ දී **www.moha.gov.lk** වෙබ් අඩවිය මඟින් ලංසු ලේඛන පරීක්ෂා කිරීමේ අවස්ථාව සැපයුම්කරුවන් වෙත ලබා දී ඇත.

03. මුද්‍රා තබන ලද ලංසු 'මුල් පිටපත' හා 'අනු පිටපත' වශයෙන් පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම මුද්‍රා තබා සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ආරක්ෂක සේවා සැපයීම සඳහා ලංසු කැඳවීම 2025-2026"** යනුවෙන් සඳහන් කර 2025.08.27 දින ප.ව. 02.00 ට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් හෝ 'නිල මැදුර', ඇල්විටිගල මාවත, කොළඹ 05 පිහිටි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය – ස්වදේශ කටයුතු අංශයේ 16 වන මහලේ මූල්‍ය අංශයේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ලංසු ඉදිරිපත් කළ හැක. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු 2025.11.26 දින දක්වා වලංගු විය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් ලංසු ඉදිරිපත් කරන්නේ නම් පහත ලිපිනයට එවිය යුතුය. (ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

**ගණකාධිකාරී (ප්‍රසම්පාදන),**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,**
**ස්වදේශ කටයුතු මූල්‍ය අංශය,**
**16 වන මහල,**
**නිල මැඳුර,**
**ඇල්විටිගල මාවත, කොළඹ 05.**

04. ලංසු භාර ගැනීම 2025.08.27 වන දින ප.ව. 02.00 ට අවසන් වූ වහාම 'නිල මැදුර' ගොඩනැගිල්ලෙහි 16 වන මහලෙහි පිහිටි ස්වදේශ කටයුතු මූල්‍ය අංශයේ දී එනම්, **2025.08.27 දින ප.ව. 02.15 ට** ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසු කරුවන්ට හෝ ඔවුන් විසින් ලිඛිතව බලය පවරන අයෙකුට සහභාගි විය හැක.

**වැඩි විස්තර සඳහා දුරකථන අංකය - 011-2050412**

**ලේකම්,**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ස්වදේශ කටයුතු අංශය,**
**"නිල මැදුර",**
**ඇල්විටිගල මාවත,**
**නාරාහේන්පිට, කොළඹ 05.**